**නෙළුව ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

**------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 11 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 නොවැම්බර් 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට නෙළුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

සැපයුම් හා උපකරණ වියදම රු.38,182 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

**--------------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.63,149,997 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂ සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන / උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.7,939,238 ක අසමානතා පවතින බව නිරීක්ෂණය විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

**-------------------**

වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.72,839 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර, ගිණුම නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) (i) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත 09 ක් වෙනුවෙන් ලැබිය යුතු එකතුව රු.3,687,277 ක් වූ රජයේ ආධාර මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.44,300 ක් වූ බලපත්‍ර ගාස්තු ද, රු.241,085 ක් වූ කුලී මුදල් ද, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2008 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.549,800 ක් වූ සතිපොල හිඟ එක්වන් මුදල් සමාලෝචිත වර්ෂයේ දී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට කර්මාන්ත 29 ක් සඳහා ගෙවීමට තිබූ එකතුව රු.11,092,329 ක් වූ මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.41,124,248 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධව හිමිකම් පිළිබඳ ඔප්පු ද, එකතුව රු.364,155 ක් වූ හිඟ ආදායම් සම්බන්ධව යාවත්කාලීන කරන ලද ආදායම් ලේඛන ද, එකතුව රු.11,352,551 ක් වූ ණයහිමියන් සම්බන්ධව ණයහිමි ලේඛන ද, රු.104,337 ක් වූ හඳුනා නොගත් ආදායම් සඳහා ලදුපත් හා උපලේඛන ද, එකතුව රු.2,684,282 ක් වූ බැංකු ගිණුම් ශේෂ සඳහා ශේෂ සනාථ කිරීම් ද, රු.116,497 ක් වූ නිකුත් කළ නමුත්, ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් සඳහා චෙක්පත් නිකුත් කළ දිනය ද, ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

-----------------------------------------------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1645 හා 1646 ප්‍රකාරව සභාවට අයත් වාහන 11 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.1,620,948 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.226,718 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,394,230 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 අක්කර බදු**

සමාලෝචිත වර්ෂය අවසානයට රු.29,460 ක හිඟ අක්කර බදු ශේෂයක් නිරීක්ෂණය විය. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1)(අ) වගන්තිය ප්‍රකාර හිඟ අක්කර බදු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.2.2 බදු කුලී ආදායම**

සමාලෝචිත වර්ෂය අවසානයට රු.241,085 ක හිඟ බදු කුලී ආදායමක් නිරීක්ෂණය විය. කුලී බදුකරුවන් 10 දෙනෙකුගෙන් දිගින් දිගටම රු.10,000 ට වඩා වැඩි හිඟ ශේෂයක් අය වියයුතුව තිබූ අතර, එය අයකර ගැනීමට ප්‍රමාණවත් උත්සාහයක් ගෙන නොතිබුණි.

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.5,000,000 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.243,792 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) අළුත්වැඩියා කර ධාවනයට යොදාගත හැකිව තිබූ wpSE 2811 දරන අත් ට්‍රැක්ටරය හා spVG 2330 දරන යතුරුපැදිය පිළිවෙලින් 2012 වර්ෂය හා 2015 වර්ෂයේ සිට ධාවනයට යොදවාගෙන නොතිබුණි.

(ආ) JA 2763 දරන ට්‍රැක්ටරය හා JB 2677 දරන ටේලරය අළුත්වැඩියා නොකිරීම නිසා ධාවනයෙන් ඉවත් කර තිබුණි.

(ඇ) අංක ZA 4987 දරන බැකෝලෝඩරය සඳහා අයකර ගත යුතුව තිබුණු හිඟ ආදායම රු.229,759 ක් විය.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 05 ක එකතුව රු.12,366,035 ක් වූ ඉතිරිවීම් ද, තවත් විෂයයන් 02 ක රු.89,632 ක් වූ අහිතකර විචලනයන් ද, ආදායම් විෂයයන් 07 ක එකතුව රු.10,118,934 ක් වූ ළඟාකර නොගත් ඉලක්ක ආදායම් ද පැවැතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

-----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක : දපපා/යහ/ 01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කලමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

---------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධතිය | | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | ඉඩම්වල හිමිකම් ඔප්පු නොතිබුණි. |
| | | (ii) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සමීක්ෂණයන් පවත්වා ඒවායේ වටිනාකම් තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි. |
| | | (iii) | සභාව සතු ප්‍රජා ශාලා, සුසාන භූමි සහ පොදු ස්ථාන පිළිබඳ තොරතුරු ඇතුළත් කර ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (iv) | සභාව විසින් හානි හා පාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) | ආදායම් රැස්කිරීම | | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) | ගිණුම්කරණය හා ලේඛන පැවැත්වීම | (i) | ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙන එන ගිණුම් ශේෂ පිළිබඳව සොයා බලා ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | මූල්‍ය ප්‍රකාශනවල සහ ඊට අදාළ උපලේඛන වල දැක්වෙන ශේෂ අතර, පවතින වෙනස්කම් |

| | | | |
|---|---|---|---|
| | | | හඳුනාගෙන අදාළ ගැලපීම් කර ගිණුම් නිවැරදි කර නොතිබුණි. |
| (ඇ) | කළමනාකරණ අකාර්යක්ෂමතා | (i) | කසළ කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණි. |
| | | (ii) | වාහනවල පැවති සුළු අළුත්වැඩියාවන් සිදුකර, ධාවනයට යොදාගෙන නොතිබුණි. |
| | | (iii) | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | අයවැය පාලනය | (i) | වාර්ෂික අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන වෙන් කරවාගෙන ඇති වියදම් විෂයයන් 02 ක සම්පූර්ණ ප්‍රතිපාදනය ද, තවත් වියදම් විෂයයන් 05 ක සැලකිය යුතු ඉතිරිවීම් ද පැවැතුණි. |
| | | (ii) | අනුමත සීමාව ඉක්මවා වියදම් විෂයයන් දෙකක වියදම් දරා තිබුණි. |
| | | (iii) | ආදායම් විෂයයන් 07 ක අයවැය ලේඛනයේ දක්වා තිබූ ආදායම් ඉලක්ක ළඟා කරගෙන නොතිබුණි. |
| | | (iv) | වියදම් සහ ආදායම් පිළිබඳ පසු විපරම් කර, අයවැය සංශෝධනය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. |